දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග - 2015 හා 2019 (පුනර් 2015) පරීක්ෂණය - 2020 පෙබරවාරි/මාර්තු

Bachelor of Arts General (External) Degree Part I – 2015 & 2019 (2015 Repeat) Examination–February/March 2020

# ආවිසා 2.1 - සූක්ෂම ආර්ථික න්‍යාය

# ECG 2.1 - Micro Economic Theory

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ

---

01. I. උපේක්ෂා වක්‍ර සිතියමක ප්‍රධාන ගුණාංග විස්තර කරන්න.

(ලකුණු 04)

II. උපේක්ෂා වක්‍රයක බෑවුමෙන් නියෝජණය වන ආන්තික ආදේශණ අනුපාතය හීන වන බල කල්පිත දත්ත භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

III. සාමාන්‍ය භාණ්ඩයක මෙන්ම බාල භාණ්ඩයක ද මිල අඩුවීමක ආදේශන ප්‍රතිවිපාකය එකම ස්වරූපයක් ගන්නා නමුත් ආදායම් ප්‍රතිවිපාකයේ හැසිරීම එකිනෙකට ප්‍රතිවිරුද්ධ වේ. උපේක්ෂා වක්‍ර විග්‍රහය භාවිතා කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

02. I. උපේක්ෂා වක්‍ර විග්‍රහයේ දී මිල වෙනස් වීමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය වෙන් කර හඳුනා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රම වේදයන් යොදා ගත හැකි ආකාරය අවශ්‍ය රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(අ) ආදායමේ වන්දි විචලන ක්‍රමය

(ආ) ආදායමේ සමාන විචලන ක්‍රමය

(ඇ) පිරිවැය වෙනස ක්‍රමය

(ලකුණු 15)

II. උපේක්ෂා වක්‍ර විග්‍රහයේ දී පාරිභෝගික අතිරික්තය මිනුම් කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

03. අවශ්‍ය තැන්හි ප්‍රස්තාර සටහන් හා උදාහරණ භාවිත කරමින් පහත සඳහන් ප්‍රකාශ කෙටියෙන් පැහැදිලි කරන්න.

I. "තාවකාලික සමතුලිතයෙන් ඇත්වූ වෙළෙඳපොළක් නැවත සමතුලිතය කරා ගෙන එන බලවේගය ලෙස මාර්ෂල් අදහස් කළේ ප්‍රමාණය හැඩ ගැසීමයි"

II. "කේන්ද්‍රාභිසාරී මිල උච්චාවචනයේ දී මිල, උච්චාවචන සහිතව ක්‍රම ක්‍රමයෙන් සමතුලිතය කරා ළඟා වේ"

III. "ස්වයංපෝෂිත ආර්ථිකයකට සාපේක්ෂව හුවමාරු ආර්ථිකයක් සමාජ සුභසාධනය ඉහළට යොමු කරයි."

IV. "කෝණීය විසඳුම් අවස්ථාවකදී පාරිභෝගිකයා, සමතුලිත වනුයේ භාණ්ඩ වර්ග දෙකෙන් එක් වර්ගයක භාණ්ඩ පමණක් මිලදී ගැනීමෙනි"

(ලකුණු 20)

04. I. නිෂ්පාදන ශ්‍රිතයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 02)

II. දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතයකින් කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයක් වෙනස් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 03)

III. සුදුසු සම නිෂ්පාදන වක්‍ර සිතියම් භාවිත කරමින් පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

1. වැඩෙන පරිමානානුකූල ඵල
2. ස්ථාවර පරිමානානුකූල ඵල
3. හීනවන පරිමානානුකූල ඵල
4. ප්‍රශස්ත සාධක සංයෝග
5. ප්‍රසරණ මාර්ගය

(ලකුණු 15)

05. අවශ්‍ය තැන්හිදී රූප සටහන් හා උදාහරණ භාවිත කරමින් පහත සඳහන් ප්‍රකාශ පැහැදිලි කරන්න.

I. "පූර්ණ තරඟකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය තිරස් අක්ෂයට සමාන්තර රේඛාවක් වන නමුත්, මුළු අයභාර වක්‍රය මූලයේ සිට ඉහළ නගින ධන බෑවුමක් ගන්නා රේඛාවකි."

II. "පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේ දී අලාභ ලැබුවත් තවදුරටත් නිෂ්පාදනයේ නිරත විය හැකිය"

III. "පූර්ණ තරඟකාරී ආයතනයක සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයට ඉහලින් පිහිටි ආන්තික පිරිවැය වක්‍රය එම ආයතනයේ කෙටි කාලීන සැපයුම් වක්‍රය වේ."

IV. පූර්ණ තරඟකාරී ආයතනයක දිගුකාලින සමතුලිත අවස්ථාවේ දී ආර්ථික ලාභ ශූන්‍ය වේ."

(ලකුණු 20)

06. ඒකාධිකාරී ආයතනයක ඉල්ලුම් ශ්‍රිතය $P = 60 - 2Q$ වන අතර මුළු පිරිවැය ශ්‍රිතය $TC = 12Q + 2Q$ වේ.

I. මෙම ආයතනයේ අරමුණ ලාභ උපරිම කිරීම නම්, එම අවස්ථාවේ දී,

a) එම භාණ්ඩයේ මිල ගණනය කරන්න
b) එම භාණ්ඩයේ ප්‍රමාණය ගණනය කරන්න
c) උපරිම ලාභය ගණනය කරන්න
d) පාරිභෝගික අතිරික්තය ගණනය කරන්න
e) එම අවස්ථාවේ මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කරන්න.

(ලකුණු 10)

II. මෙම ඒකාධිකාරයාගේ සිය අරමුණු ලාභ උපරිම කිරීම නොව විකුණුම් අයභාරය උපරිම කිරීම ලෙස තීරණය කලේ නම් එම අවස්ථාවේ දී

(a) එම භාණ්ඩයේ මිල ගණනය කරන්න
(b) එම භාණ්ඩයේ ප්‍රමාණය ගණනය කරන්න
(c) උපරිම ලාභය ගණනය කරන්න
(d) පාරිභෝගික අතිරික්තය ගණනය කරන්න
(e) එම අවස්ථාවේ මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කරන්න.

(ලකුණු 10)

07. I. භාණ්ඩ වෙළෙඳ පොළ හා සාධක වෙළෙඳ පොළ පූර්ණ තරඟකාරී අවස්ථාවක දී සාධක සේවා නියුක්තිය හා එහි මිල තීරණය වන ආකාරය අවශ්‍ය රූප සටහන් භාවිත කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

II. භාණ්ඩ වෙළෙඳ පොළ ඒකාධිකාරයේ හා සාධක වෙළෙඳ පොළ පූර්ණ තරඟයේ පවතින අවස්ථාවක සාධක සේවා නියුක්තිය හා එහි මිල තීරණය වන ආකාරය අවශ්‍ය රූප සටහන් භාවිත කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

III. "සාධක වෙළෙඳ පොළ තුල ඒකාධිකාරී සූරා කෑමක් ඇතිවනුයේ සාධක වෙළෙඳ පොළ අපූර්ණ තරඟයේ පැවතීම නිසා නොව භාණ්ඩ වෙළෙඳ පොළ ඒකාධිකාරී වීම නිසාවෙනි." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 07)

08. පහත සඳහන් සංකල්ප අතරින් හතරක් (04) විස්තර කරන්න.

I. වැටි රේඛා

II. නිෂ්පාදනයේ අදියර තුන

III. යෙදවුම් පූර්ණ අනුපූරක අවස්ථාවක සම නිෂ්පාදන වක්‍ර සිතියම

IV. ස්විසිගේ ව්‍යවර්තන ඉල්ලුම් වක්‍ර විග්‍රහය

V. ආර්ථික බදු කුලිය

VI. ආන්තර බදු කුලිය

(ලකුණු 20)

❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖